// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1919/82 - 2015 ජුනි මස 19 වැනි සිකුරාදා - 2015.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : සීඑස්ඒ/7/8/15.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

1. මැක්ස්වෙල් පරාක්‍රම පරණගම මැතිතුමා
2. දිමින්ගු බඩතුරුගේ ප්‍රියන්ති සුරංජනා විද්‍යාරත්න මැතිතුමිය
3. මනෝ රාමනාදන් මැතිතුමිය

වෙත,

ශුභාශිංසන පෙරටුවයි !

පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 වැනි අධිකාරය වූ) 2 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර, වර්ෂ 2013 ක් වූ අගෝස්තු මස 12 වැනි දිනැති අධිකාර පත්‍රය මගින්, ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්හි පදිංචිව සිටි යම් තැනැත්තන් සිය කැමැත්තෙන් තොරව ඔවුන් පදිංචි ස්ථානවලින් ඉවත්කරගෙන යනු ලැබ හෝ අතුරුදහන්වී ඇත්ද යන වග පරීක්ෂා කිරීමේ පරීක්ෂණ කොමිෂන් සභාවට ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, වරින්වර එම මුල් අධිකාර පත්‍රයට සංශෝධන හා එකතුකිරීම් කරනු ලැබ ඇති හෙයින්ද,

තවද, මෙම කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යය භාරය වැඩිවීමත් සමගම එහි කාර්යයන් වඩාත් කඩිනමින් සහ කාර්යක්ෂමව සපුරාලීම පිණිස දැනට ධුර දරන කොමසාරිස්වරුන් ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව මවිසින් හඳුනාගනු ලැබ ඇති හෙයින්ද,

1A - G 21736 — 11 (2015/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 3 වන වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව විශ්‍රාමික මහාධිකරණ විනිසුරු විජේසේකර ආරච්චිගේ තිලකරත්න රත්නායක මැතිතුමා සහ විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් හේවාහෙට්ටිගේ සුමනපාල මැතිතුමා, එතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍ය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින්, ඉහත කී අධිකාරි පත්‍රය ප්‍රකාර ස්ථාපනය කරනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් ලෙස මෙයින් පත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් පහළොවක් වූ ජුනි මස 18 වන දින වන මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. අබේකෝන්,

ජනාධිපති ලේකම්.

07 - 300

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.